රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව (PERC)

# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පිළිබඳ සමාලෝචන වාර්තාව

# පටුන


| මාතෘකාව | පිටු අංකය |
| --- | --- |
| හැඳින්වීම | 01 |
| ක්‍රමවේදය | 02 |
| සමාලෝචනය හා නිර්දේශ | 04 |

## හැඳින්වීම

2023.02.06 දිනැති අංක 23/0256/604/030 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ප්‍රධාන අමාත්‍යාංශ දහයක වියදම් සමාලෝචනය කිරීම සඳහා කමිටු දහයක් පිහිටුවා ඇත. ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයක් භාවිතා කරමින් ක්‍රමානුකූල සමාලෝචනයක් මගින් රජයේ වියදම් තාර්කීකරණය කිරීමට සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා එම කමිටුවලට බලය පැවරිණි.

ශුන්‍ය-පාදක අයවැයකරණය යනු, සෑම වියදම් අයිතමයක්ම එහි පෙර අරමුදල් තත්ත්වය කුමක් වුවද, මුල සිටම සාධාරණීකරණය කළ යුතු අයවැය ක්‍රමයකි. ඉකුත් වර්ෂයේ අයවැය මූලික පදනමක් ලෙස සලකා ආරම්භ වන සාම්ප්‍රදායික අයවැය ක්‍රම මෙන් නොව, ශුන්‍ය-පාදක අයවැයකරණයේ දී දෙපාර්තමේන්තු, ඒකක ආදිය විසින් එක් එක් වියදම් අයිතමයන් තනි තනිව සාධාරණීකරණය කරමින්, ශුන්‍යයේ සිට තම ආයතනයට අදාළ අයවැය සකස්කළ යුතුය. මෙහිදී එක් එක් ව්‍යාපෘතිය, ක්‍රියාකාරකම හෝ වියදම්වල අවශ්‍යතාවය සහ වටිනාකම විශ්ලේෂණාත්මකව ඇගයීමට ලක් කිරීම අවශ්‍ය වේ. වඩාත් විනිවිද භාවයෙන් සහ වගවීමෙන් යුතු මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීමේදී, අවශ්‍ය සම්පත්, අපේක්ෂිත ප්‍රතිඵල සහ පවතින විකල්ප පිළිබඳව සවිස්තරාත්මකව පරීක්ෂා කර බැලීම වැදගත් වේ.

අමාත්‍යාංශයේ මූලික ක්‍රියාකාරකම් සහ කාර්යභාරය තහවුරු කිරීම, ද්වීකරණයන්, නාස්තිය සහ අත්‍යවශ්‍ය නොවන ව්‍යාපෘති හෝ වියදම් හඳුනාගැනීම, දැනටමත් වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම සහ ශුන්‍යපාදක අයවැයකරණ ප්‍රවේශයක් මඟින් පිරිවැය-ඵලදායී ලෙස අමාත්‍යාංශය විසින් සිය වගකීම් ඉටු කරන බවට සහතික වීම යන වගකීම් මෙම කමිටු වෙත පවරා ඇත.

ඒ අනුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වියදම් සමාලෝචනය කිරීම සඳහා වන කමිටුවට පහත සඳහන් පුද්ගලයින් පත් කර ඇත.

| | | |
|---|---|---|
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | සභාපති |
| එම්.එල්. ගම්මම්පිල මහතා | අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සාමාජික |

| | | |
|---|---|---|
| මහාචාර්ය ඩී.ඒ. ප්‍රේමකුමාර ද සිල්වා මහතා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය | සාමාජික |
| මහාචාර්ය දිල්රුක්ෂි යාපා අබේවර්ධන මිය | මහාචාර්ය/ ගිණුම්කරණ දෙපාර්තමේන්තු ප්‍රධානී, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය | සාමාජික |
| ආචාර්ය මුදිත් සුජීව මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය | සාමාජික |
| එම්.ජේ.එම්. ඉෆ්හාම් මහතා | අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | කැඳවුම්කරු |

## ක්‍රමවේදය

අමාත්‍යාංශ නාමයෙහි සඳහන් පරිදිම, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අතීතයේ වෙන් වෙන් අමාත්‍යාංශ වශයෙන් පැවති ප්‍රධාන අංශ තුනකින් සමන්විත වන බැවින් සහ 2023 වර්ෂයේ දී එහි අයවැය රුපියල් බිලියන 922 ක් වන බැවින්, කමිටුව විසින් විශ්‍රාම වැටුප් සහ සේවා වන්දි ඇතුළු පහත සඳහන් කාණ්ඩ අනුව එම අංශ තුන පිළිබඳව අදාළ ප්‍රතිපාදන ද සමඟ වෙන් වෙන් වශයෙන් පරීක්ෂාකර බැලිය යුතුවිය.

| **කාණ්ඩ** | **ප්‍රතිපාදන** (රු.බි.) |
|---|---|
| රාජ්‍ය පරිපාලන | 04 |
| විශ්‍රාම වැටුප් සහ මියගිය හා තුවාල ලැබූ රණවිරුවන්ගේ සේවා වන්දි | 418 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු ස්වදේශ කටයුතු | 54 |
| පළාත් සභා සහ පළාත් පාලන | 446 |
| **එකතුව** | **922** |

කමිටුව විසින් ආයතනයේ මෙහෙවර සහ දැක්ම පිළිබඳව අධ්‍යයනය කර අමාත්‍යාංශයේ එක් එක් වැඩසටහන්/ ව්‍යාපෘති/ උප ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් ආදිය එහි අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා දායක වන ආකාරය පිළිබඳව සමාලෝචනය කර ඇත. තවද, පවත්නා අයවැය ඇස්තමේන්තුවල පිළිබිඹු වන ද්විකරණයන්, නාස්තිය සහ අත්‍යවශ්‍ය නොවන ව්‍යාපෘති හෝ වියදම් හඳුනා ගැනීම

කෙරෙහි අවධානය යොමු කර ඇත. එසේම, ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීමට අත්‍යවශ්‍යවන මූලික ව්‍යාපෘති කවරේද යන්න හඳුනාගැනීම සඳහා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳව ද කමිටුවේ විශේෂ අවධානය යොමුකර ඇත. අමාත්‍යාංශයේ වියදම් සමාලෝචනය සඳහා, යුරෝපා කොමිසම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව[1] විසින් නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තක්සේරු කිරීමේ රාමුව ද කමිටුව විසින් සලකා බලන ලදී.

මෙම අමාත්‍යාංශය විසින් රාජ්‍ය අංශයේ මානව සම්පත් පරිපාලනය කරනු ලබන බැවින්, විශේෂයෙන් මෙම අමාත්‍යාංශයේ පවතින කාර්යමණ්ඩලය මෙන්ම සමස්ත රාජ්‍ය අංශයේ මානව සම්පත හා සම්බන්ධ ගැටළු කමිටුව විසින් සැලකිල්ලට ගෙන ඇත. ඇතැම් කාණ්ඩ සඳහා අධික ලෙස බඳවා ගැනීම්, තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය, ප්‍රතිපත්තිමය අනනුකූලතා සහ වෙනත් අදාළ කරුණු පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් කෙරිණි.

කමිටුව විසින් එක් එක් වියදම්වල පිරිවැය ඵලදායීතාවය, රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව, ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම සහ පරිශීලක ගෙවීම් යාන්ත්‍රණ ඇතුළුව කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ සහ පිරිවැය අඩු කිරීමේ ක්‍රමවේද කෙරෙහි ද අවධානය යොමු කර ඇත. ඉලක්ක සපුරා ගැනීම ඇගයීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සැලකිල්ලට ගෙන ඇත.

කමිටුව විසින් පහත පරිදි රැස්වීම් පහක් පවත්වන ලදී.

| රැස්වීම් දිනය | සාකච්ඡාව |
|---|---|
| 17.03.2023 | මූලික සාකච්ඡාවේදී යොමුගත කොන්දේසිවලට අදාළ වන පරිදි අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමු විය. |
| 31.03.2023 | • ඊ-ග්‍රාම නිලධාරී (e-GN) ව්‍යාපෘතියේ, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ, මුදල් කොමිෂන් සභාවේ, ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් සමඟ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡාව<br>• විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, e-GN ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් වියදම් තාර්කීකරණය පිළිබඳ ලිඛිත නිරීක්ෂණ/අදහස් ඉදිරිපත් කරන ලදී. |

[1] https://www.pefa.org/sites/pefa/files/resources/downloads/PEFA%202016_latest%20version_with%20links%20%282%29.pdf

| | |
|---|---|
| | • ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා නිලධාරීන් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සිදු කරන ලද සාකච්ඡාව |
| 06.06.2023 | • රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සිදු කරන ලද සාකච්ඡාව<br>• කමිටුවේ කෙටුම්පත් වාර්තාව පිළිබඳ සාකච්ඡාව |
| 11.07.2023 | • කළුතර සහ ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරුන් සහ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු සමඟ දිස්ත්‍රික් පරිපාලනය සහ ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධ ගැටළු පිළිබඳ සාකච්ඡාව.<br>• කොළඹ සහ දෙහිවල-ගල්කිස්ස මහනගර සභා, පෑලියගොඩ සහ කළුතර නගර සභා, ජා-ඇල සහ හොරණ ප්‍රාදේශීය සභා යන ආයතන වල නිලධාරීන් සහ දකුණු සහ බස්නාහිර පළාත් සභා වල පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පළාත් පාලනය ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් කමිටුවට කරුණු ඉදිරිපත් කරන ලදී .<br>• ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘති අධ්‍යක්ෂ, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡාවක් ද සිදු කරන ලදී. |
| 11.08.2023 | කමිටුව විසින් කෙටුම්පත් වාර්තාව නිම කිරීමේ කටයුතු |

## සමාලෝචනය සහ නිර්දේශ

ඉහත සඳහන් කරන ලද ආයතන විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ නිරීක්ෂණ සහ මෙම වාර්තාව සකස් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද කරුණු සහ ලේඛන කමිටුව විසින් සලකා බලන ලදී. සමාලෝචන ක්‍රියාවලියේදී හඳුනාගත් කරුණු සහ කමිටුවේ නිර්දේශ පහත දැක්වේ.

### *01: ඇතැම් කාණ්ඩවල සහ ආයතනවල අතිරික්ත කාර්ය මණ්ඩලයක් පවතින විට අනෙකුත් ආයතනවල සහ කාණ්ඩවල හිඟයක් පැවතීම හේතුවෙන් අකාර්යක්ෂමතාවයන් ඇති වීම*

දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පවතින අතිරික්ත කාර්යමණ්ඩල හේතුවෙන් පරිපාලන හා සේවා සැපයීමේ ගැටළු සහ අඩු වැටුප් සහිත හා ඌන උපයෝජිත ශ්‍රම

බලකායක් නිර්මාණය වී ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර වැනි තනතුරු සහ ඒ හා සමාන මට්ටමේ වෙනත් නිලධාරීන් හට බොහෝ දුරට ග්‍රාම නිලධාරීවරයා විසින් ඉටු කළ හැකි රාජකාරි පැවරී ඇත. රාජ්‍ය සේවාවන් ඩිජිටල්කරණය වීමත් සමඟම, මෙම තනතුරු බොහොමයක් යල් පැන ගිය තත්ත්වයට පත්ව මහා භාණ්ඩාගාරයට බරක් වනු ඇත. මෙම කාරණය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් විසින් තහවුරු කර ඇත.

***නිර්දේශ:***

i. රාජකාරි පිළිබඳ පූර්ණ අධ්‍යයනයකින් සහ ප්‍රතිඵල තක්සේරුවෙන් අනතුරුව, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් කාර්යමණ්ඩලය පිළිබඳ සමාලෝචනයක් සිදුකර කාර්යමණ්ඩල අවශ්‍යතාවය තාර්කිකව නිශ්චය කළ යුතුය.
ii. බාහිර ආයතන වෙතින් සේවා ලබාගැනීම (outsourcing), අතිරික්තයක් පවතින ආයතන වලින් සේවක සංඛ්‍යා සංචිතගත කර ලබාගැනීම වැනි අනෙකුත් විකල්ප සියල්ල භාවිතා කර අවසන් වීමෙන් පසුව පමණක් අනිවාර්ය අවශ්‍යතාවයන් සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය.
iii. දැනට සිටින සංවර්ධන නිලධාරීන් හට නිෂ්පාදන ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමෙහි ලා නියැලිය හැකි වනු පිණිස ඔවුන්ව අනුමත බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි හරහා ව්‍යාප්ති සේවා සහ තාක්ෂණික තනතුරු වැනි අත්‍යවශ්‍ය කාර්යමණ්ඩල තනතුරු සඳහා අභ්‍යන්තරව බඳවා ගත යුතු ය.
iv. ද්වීකරණයන් ලෙස සැලකෙන සේවාවන් නැතිවී යමින් පවතින සේවාවන් බවට පත් කළ යුතුය.
v. සැබෑ අවශ්‍යතා සලකා බලා තරඟ විභාග සහ කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කළ යුතුය.
vi. සමූහ බඳවා ගැනීම් නතර කළ යුතුය.

## *02: රජයේ රැකියා සඳහා උපාධිධාරීන් අතර පවතින ඉහළ ඉල්ලුම*

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත රැකියා ලබා ගැනීම සඳහා උපාධිධාරීන් අතර පවතින ඉහළ ඉල්ලුම උද්ඝෝෂණ සහ බලපෑම් කිරීම් ආදියට තුඩු දෙන බව කමිටුවේ අදහසයි. මෙම ගැටළුවේ දේශපාලනික වශයෙන් පවතින සංවේදිතාවය අතීතයේ සිදු වූ උපාධිධාරී රැකියා වැඩසටහන සහ රැකියා ලක්ෂයේ වැඩසටහන වැනි සමූහ බඳවා ගැනීම් සඳහා පාදක වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍ය සේවය සේවකයන් මිලියන 1.4කට වර්ධනය වී ඇත. තවද, සමූහ බඳවා ගැනීම් උගත් ශ්‍රම බළකායක් පෞද්ගලික අංශයට අහිමි කර ඇති බවද නිරීක්ෂණය විය.

***නිර්දේශ:***

i. නිපුණතා සහ සහනදායී ණය ලබා දීම තුළින් උපාධිධාරීන් ව්‍යවසායකත්වය කරා යොමු කිරීම.

ii. රාජ්‍ය අංශය විසින් ඩිජිටල් පරිවර්තනයන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සඳහා විශාල වශයෙන් ආයෝජන සිදු කරනු ලබන බැවින්, මෘදුකාංග සංවර්ධනය, දත්ත විශ්ලේෂණය, සයිබර් ආරක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපෘති කළමනාකරණය සහ විශ්ලේෂණාත්මක චින්තනය පිළිබඳ කුසලතා ඇති උපාධිධාරීන්ට බඳවා ගැනීම් වලදී ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

***03: ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය***

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනන්‍ය ව්‍යාපෘතියක් වන ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය තවමත් අවසන් කර නොමැති බව කමිටුවේ අවධානයට පාත්‍ර වී ඇත. කමිටුව විසින් ව්‍යාපෘති කණ්ඩායමට සාකච්ඡාවක් සඳහා ආරාධනා කරන ලදී. ඉ-ග්‍රාම (e-GN) නිලධාරී ව්‍යාපෘති අධ්‍යක්ෂ වන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින්, සමස්ත රාජ්‍ය සංකල්පය මත පදනම් වූ මූලික දත්ත පද්ධතියක් පිහිටුවීම සහ රාජ්‍ය ආයතන අතර දත්ත හුවමාරු කිරීම සහ තොරතුරු සත්‍යාපනය සඳහා ඉඩ සලසනු ලබන තනි ඩිජිටල් අවකාශයක් ආදී ව්‍යාපෘතියේ නිමැවුම සහ ප්‍රතිඵල පිළිබඳ කමිටුව වෙත පැහැදිලි කරන ලදී. 2023 වර්ෂයේ ජාතික අයවැය යටතේ රුපියල් මිලියන 1,500ක් වෙන් කර ඇති බවට නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන කටයුතු ඉදිරියට කරගෙන යාම පිළිබඳ ගැටළු, රේඛීය අමාත්‍යාංශවල හදිසි වෙනස්වීම් සහ පරස්පර ප්‍රතිපත්තිමය තීරණ මඟින් ව්‍යාපෘතිය සුමටව ක්‍රියාත්මක කිරීමට බාධා පමුණුවා ඇති බවට අවධාරණය කෙරිණි. එබැවින්, තවදුරටත් ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පළමු අදියර වශයෙන් කොළඹ, ගම්පහ, කළුතර සහ පුත්තලම ඇතුළු දිස්ත්‍රික්ක 07 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බවත් ඉන් අනතුරුව, ක්‍රමානුකූලව රට පුරා ව්‍යාප්ත කිරීමට කටයුතු කරන බවත් දැනුම් දෙන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ දත්ත රැස්කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත. ග්‍රාම නිලධාරීන් හට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම හා නිපුණතා ලබා දී ඇති බවත්, සේවා සපයනු ලබන ආයතන වෙතින් එම කටයුතු පවරා ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් සහිත අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර ඇති බවත් වැඩිදුරටත් පැහැදිලි කෙරිණි. තවද, කමිටුව විසින් තොරතුරු හා සම්පත් හුවමාරු කර ගැනීම පිළිබඳව සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක නිරත විය. ඉ-ග්‍රාම නිලධාරී (e-GN) යනු සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යටතේ "අස්වැසුම වැඩසටහන" සඳහා රැස් කරන ලද තොරතුරු සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් රැස් කරන දත්තවලට වඩා පුළුල් තොරතුරු සමුදායක් රැස් කරනු ලබන සේවා පාදක දත්ත සමුදායක් බව ඔවුන් විසින් දන්වා සිටින ලදී.

***නිර්දේශ:***

i. ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය දියත් කිරීම ක්‍රමක්‍රමයෙන් සිදු කළ යුතු අතර දත්ත පත්‍රිකා පරිලෝකනය කිරීමේ (scanning) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම දිස්ත්‍රික්ක වශයෙන් සිදු කළ හැකිය.

ii. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මේ වන විට ආරම්භ කර ඇති ක්‍රියාවලිය දැනට පවතින සම්පත් හා මුද්‍රණය කර ඇති ද්‍රව්‍ය යොදා ගනිමින් සම්පූර්ණ කර සේවා සැපයීම ආරම්භ කිරීම. එවිට, ව්‍යාපෘතිය අනෙකුත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කළ හැකිය.

iii. නඩත්තු සේවාවන් පිරිවැය ඵලදායී ආකාරයෙන් සේවා ගිවිසුම් හරහා බාහිරින් ලබා ගත හැකිය.

iv. දත්ත රැස්කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා උපාධි අපේක්ෂකයින් දත්ත එකතු කරන්නන් ලෙස යොදා ගැනීමට විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

v. ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියේ තිරසාර බව සහතික කිරීමේ සැලැස්මක් තිබිය යුතුය.

## ***04: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවා සැපයීම ශක්තිමත් කිරීම***

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ එහි නිලධාරීන් කමිටුව වෙත කරුණු ඉදිරිපත් කළහ. ඔවුන් විසින් පැහැදිලි කරන ලද පරිදි, දෙපාර්තමේන්තුව විසින් මූලික වශයෙන් උප්පැන්න, විවාහ, මරණ සහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. දෙපාර්තමේන්තුව සිය සේවා සැපයීම් ඩිජිටල්කරණය කරමින් පවතින අතර වර්ධනයන් කිහිපයක් අත් කරගෙන ඇත. කෙසේ වුවද, විශේෂයෙන්ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ මානව සම්පත් ධාරිතාවයේ හිඟකම එහි ප්‍රගතියට බාධාවක් වී ඇත. දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය වියදම්වලින් තුනෙන් දෙකක් පමණ සේවා ගාස්තු හරහා උපයන බව නිරීක්ෂණය විය. සේවා ගාස්තු ගණනයේදී සියලුම පිරිවැය ඇතුළත් නොවූ අතර, ඇතැම් පිරිවැය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වැනි වෙනත් ආයතන විසින් LGN

Cloud ජාලය හරහා දරා ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. මෙහි දී, ඩිජිටල්කරණ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. මෙම ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි සරල කළ යුතු බව ද මෙහිදී තවදුරටත් අවධාරණය කෙරිණි. ඔප්පු ලියාපදිංචි කිරීමේදී ඉඩම් වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම රාජ්‍ය ආදායම අඩුවීමට හේතු වේ යන කාරණය පිළිබඳව කමිටුවේ විශේෂ අවධානය යොමුවී ඇත.

***නිර්දේශ:***

i. සේවා සැපයීම සඳහා පිරිවැය පිළිබිඹු වන මිලකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කළ යුතුය.

ii. කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය වැඩි කිරීම සඳහා සේවා සැපයීම ඩිජිටල්කරණය කිරීම කඩිනම් කළ යුතුය.

iii. අවශ්‍ය තනතුරු ඇති කිරීම සහ බඳවා ගැනීම් මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මානව සම්පත් ධාරිතාවය වැඩිදියුණු කළ යුතුය.

iv. රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා සම්පත් වෙන් කිරීම පිළිබඳ නිසි සැලැස්මක් සකස් කළ යුතුය.

v. ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ලබා ගැනීම අනිවාර්ය කළ යුතු වේ.

## *05: විමධ්‍යගත විෂයයන් සඳහාද ජාතික අමාත්‍යාංශ වෙත ප්‍රතිපාදන වෙන් කිරීම*

මුදල් කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් එහි නිලධාරීන් හා කමිටුව රැස් වී පළාත් සභාවලට බලය විමධ්‍යගත කිරීම සහ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළහ. මෙහිදී සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් වූ එක් වැදගත් කරුණක් වූයේ, පළාත් සභා යටතේ ඇති විමධ්‍යගත විෂයයන් සඳහා ජාතික අමාත්‍යාංශවලට වැඩිපුර අරමුදල් ලබා දීම සහ පළාත් සභා වෙත ප්‍රමාණවත් තරම් අරමුදල් ලබා නොදීමයි. පළාත් සභා වෙත ලබාදෙන ලද අරමුදල්, නිර්ණායක මත පදනම්ව මුදල් කොමිෂන් සභාව විසින් සාධාරණ ලෙස බෙදා හරිනු ලබන අතර එම ඇතැම් නිර්ණායක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් කර ඇත. ඇතැම් ජාතික අමාත්‍යාංශවලට ලබාදෙන ලද අරමුදල් බෙදාහැරීමේදී සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ පළාත් සභාවල නිසි අදහස් ලබා ගැනීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් ද්වීකරණයන් හා අතිච්ඡාදනයන් සිදු වන බව නිරීක්ෂණය විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමගාමී ලැයිස්තුවේ විෂයයන් සම්බන්ධයෙන් මෙම ගැටළුව වඩාත් උග්‍ර වී ඇත. සාමාන්‍ය

අධ්‍යාපනය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය වැනි විදේශීය අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන දැනටමත් පළාත් සභා යටතේ වෙන් කර ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. එබැවින්, විදේශ අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල අයවැය ප්‍රතිපාදන ඍජුවම පළාත් වෙත ලබා දීම සම්බන්ධයෙන් කිසිදු නීතිමය බාධාවක් නිරීක්ෂණය වී නොමැත.

මෙම කරුණ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද අදහස්, නිරීක්ෂණ සහ යෝජනා සහ අමාත්‍යාංශයෙන් හා වෙනත් මූලාශ්‍රවලින් ලබා ගන්නා ලද තොරතුරු කමිටුව විසින් සලකා බලන ලදී.

***නිර්දේශ:***

i. ජාතික අමාත්‍යාංශ වෙත විමධ්‍යගත විෂයයන් පැවරීම සිදු නොකළ යුතුය.

ii. විමධ්‍යගත විෂයයන් ඉවත් කරමින් ජාතික අමාත්‍යාංශ සංඛ්‍යාව අඩු කළ යුතු අතර නිශ්චිතවූ විෂයයන් අනුව එය ව්‍යවස්ථානුකූලව ස්ථාවර අමාත්‍යාංශයන් බවට පත් කළ යුතුය.

iii. ජාතික අමාත්‍යාංශවලට විමධ්‍යගත විෂයයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබා නොදිය යුතුය.

iv. විමධ්‍යගත විෂයයන් සඳහා ආංශික පදනමින් පළාත් සභාවලට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ලබා දිය යුතුය.

v. ජාතික අමාත්‍යාංශ විසින් මුදල් කොමිෂන් සභාව සහ පළාත් සභා සමඟ සම්බන්ධීකරණයෙන්; ජනගහණය, සමාජ ආර්ථික දර්ශක සහ යටිතල පහසුකම් අවශ්‍යතා වැනි මුදල් කොමිෂන් සභාව විසින් භාවිතා කරනු ලබන නිර්ණායකවලට සමාන ආකාරයේ පැහැදිලි සහ විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපාදන නිර්ණායක සමගාමී ලැයිස්තුවේ විෂයයන් සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන බෙදා දීමට යොදා ගත යුතුය.

vi. මුදල් කොමිෂන් සභාව ජාතික අමාත්‍යාංශ සමඟ ආංශික රැස්වීම් පැවැත්විය යුතු අතර පළාත් සභාවල සහ අමාත්‍යාංශවල වාර්ෂික සැලසුම් ඔවුනොවුන් අතර හුවමාරු කරගත යුතුය.

vii. විමධ්‍යගත විෂයයන්ට අදාළ විදේශීය අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඒ ඒ පළාත් සභා වැය ශීර්ෂ යටතේ වෙන් කිරීම.

### *06: පළාත් සභා සඳහා ඇති සීමිත ආදායම් මාර්ග*

ව්‍යාපාර පිරිවැටුම් බද්ද (BTT) පළාත් සභා සඳහා ප්‍රධාන ආදායම් මාර්ගය වී පැවති බව කමිටුව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රතිපත්තිමය තීරණයක් හරහා BTT බද්ද එකතු කිරීම අත්හිටුවා ඇත. එම බද්ද වෙනුවට ජාතිය ගොඩනැගීමේ බද්දෙන් (NBT) පළාත් සභා වෙත තුනෙන් එකක් ලබා දී තිබූ අතර එය ද පසුව අහෝසි කරන ලදී. පළාත් සභා විසින් එකතු කරනු ලබන මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් වලින් ලබන ආදායම සම්පූර්ණයෙන්ම පළාත් පාලන ආයතන වෙත මාරුකරන බැවින් එම ආදායමද පළාත් සභා සඳහා නොලැබේ. ආදායම් මාර්ග පිරිහීමත් සමඟ පළාත් සභාවලට බඳවා ගන්නා බදු නිලධාරීන් හට ප්‍රමාණවත් වැඩ ප්‍රමාණයක් සිදු කිරීමට නොමැති බව ද මෙහිදී අවධාරණය කෙරිණි.

***නිර්දේශ:***

i. පළාත් සභා විසින් ප්‍රමාණවත් ආදායමක් උපයන බවට සහතික කිරීම සඳහා පළාත් ආදායම් මූලාශ්‍ර සමාලෝචනය කළ යුතුය.

ii. වැඩ ප්‍රමාණය අඩු බැවින් සහ දැනට සේවයේ නියුතු පළාත් සභා සේවකයින් හට සිය සාමාන්‍ය රාජකාරියේ කොටසක් ලෙස ම එම ආදායම් එකතු කිරීමේ කටයුතු ආවරණය කළ හැකි බැවින්, වැඩිදුර බඳවා ගැනීම් නැවැත්වීම සඳහා පළාත් ආදායම් සේවය නැතිවී යමින් පවතින සේවාවක් ලෙස සැලකිය යුතුය.

### *07: පළාත් සභා අධීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම*

පළාත් සභා මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල නිමැවුම් සහ සෘජු ප්‍රතිඵල අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව කමිටුව විසින් විමසා ඇත. එවැනි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට මුදල් කොමිෂන් සභාව එකඟත්වය පළ කළ ද, ඒ සඳහා ව්‍යවස්ථාපිත විධිවිධාන හෝ නීතිමය බලයක් නොමැති බව පෙන්වා දෙන ලදී. පළාත් සභා සඳහා ප්‍රතිපාදන නිර්දේශ කරනු ලබන්නේ මුදල් කොමිෂන් සභාව විසින් වන බැවින්, එම නිර්දේශිත ප්‍රතිපාදන ප්‍රමාණයට සිදුවන්නේ කුමක්ද සහ ප්‍රතිපාදන අවශ්‍යතාවය තක්සේරු කිරීමට භාවිතා කරනු ලබන නිර්ණායක කෙරේ ඇති බලපෑම් කුමක්ද යන්න නිරීක්ෂණය කිරීමේ වගකීම ඔවුන් වෙත පැවරී ඇති බව කමිටුවේ අදහසයි. මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රගති සමාලෝචන හා වාර්ෂික සමාලෝචන රැස්වීම් පවත්වනු ලබන බව සඳහන් කරන ලදී. පළාත් වල බලය ආණ්ඩුකාරවරුන් සතු වන බැවින් බඳවා ගැනීම්, උසස්වීම් සහ දීමනා ගෙවීම් ආදිය රජයේ චක්‍රලේඛවලට අනුකූල නොවීම පිළිබඳව නිසි අධීක්ෂණයකට ලක් නොවූ අවස්ථා ඇති බව සාකච්ඡාවේදී අවධාරණය කෙරිණි.

***නිර්දේශ:***

i. මුදල් කොමිෂන් සභාවේ සහාය ඇතිව ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමින් මනා නිරීක්ෂණ, අධීක්ෂණ සහ වාර්තාකරණ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම.
ii. බඳවා ගැනීම් සහ දීමනා වැනි දිගුකාලීන මූල්‍යමය බලපෑම් සහිත කරුණු සම්බන්ධයෙන් රජයේ නීති රීති රෙගුලාසිවලට අනුකූලවන පරිදි තීරණ ගැනීමට ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පළාත් ආණ්ඩුකාරවරුන් සඳහා පොදු මාර්ගෝපදේශ නිකුත් කළ හැකිය.

## ***08: පළාත් සභා විෂය පවරා ඇති අමාත්‍යාංශය හරහා ලබා දෙන ප්‍රතිපාදන සඳහා වන අක්මුදල්***

ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සෘජුවම පළාත් සභා වෙත නිකුත් කරනු ලබන බව කමිටුවේ අවධානයට යොමු විය. කෙසේ වෙතත්, අභිමතානුසාරී බවින් අඩු පුනරාවර්තන වියදම් සඳහා වන අක්මුදල් පළාත් සභා විෂය භාර අමාත්‍යාංශය හරහා ලබාදෙනු ලැබේ. මෙම ක්‍රමවේදය තුළින් ගැටලු රැසක් මතුව ඇති බව දන්වා සිටින ලදී. වැඩි සුපරීක්ෂණයක් ලබා දීමට අවශ්‍ය ප්‍රාග්ධන වියදම් සෘජුවම ලබා දී ඇති බවත් අඩු අභිමතයක් සහිත පුනරාවර්තන වියදම් රේඛීය අමාත්‍යාංශය හරහා යොමු කර ඇති බවත් කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

***නිර්දේශ:***

පළාත් සභා වෙත සෘජුවම පුනරාවර්තන ප්‍රතිපාදන ලබා දීම මඟින් පරිපාලන ප්‍රමාදයන් අවම කිරීම.

## ***09: මහා භාණ්ඩාගාරය විසින් පළාත් පාලන ආයතන වෙත ලබා දෙනු ලබන අරමුදල් තාර්කිකරණය කිරීම***

පළාත් පාලන ආයතන විසින් (LGAs) සපයනු ලබන සේවාවන් හරහා ආදායම් උපයා ගැනීමේ හැකියාව ඇති බවට කමිටුව නිරීක්ෂණය කර ඇත. පළාත් පාලන ආයතන වෙත උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු වලින් ලැබෙන ආදායම සෘජුවම ගෙවනු ලබන අතර එම ආදායම උපයෝජනය කිරීම පිළිබඳ කිසිදු අධීක්ෂණයක් නොමැත. ස්වයංමූල්‍යනය විය හැකි පළාත් පාලන ආයතන කිහිපයක්ද පවතී. කෙසේ වුවද, පළාත් සභා හරහා වාර්ෂිකව රුපියල් බිලියන 28 ක පමණ මුදලක් ලබා දීම මඟින් පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගේ සහ සේවකයින්ගේ වැටුප් පිරිවැය මහා භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ. එබැවින්, කාලානුරූපව ගාස්තු සංශෝධනය කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත කිසිදු පෙළඹවීමක් නොමැත. පළාත් පාලන ආයතන වෙත ලැබෙන ආදායමේද

සැලකිය යුතු හිඟ මුදල් තිබේ. නිලධාරීන් ආදායම් ඉලක්ක කරා ළඟා වීම වළක්වන වන දේශපාලනික මැදිහත් වීම් පිළිබඳවද මෙහිදී කරුණු ඉස්මතු කෙරිණි. පළාත් පාලන ආයතන සඳහා ලබා දෙන ප්‍රතිපාදන එක් එක් ආයතන වශයෙන් වෙන් වෙන්ව තක්සේරු කළ යුතු බව කමිටුවේ අදහසයි.

***නිර්දේශ:***

i. පළාත් පාලන ආයතන (LGAs) ස්වයංව මූල්‍යනය වන තත්ත්වයට පත්කිරීමේ හැකියාව සෙවීම සඳහා ඒවායේ මූල්‍ය තත්ත්වය විද්වත් කමිටුවක් මඟින් සමාලෝචනය කළ යුතුය.

ii. මධ්‍යම රජය විසින් පළාත් පාලන ආයතන වෙත අරමුදල් ලබාදීම ක්‍රම ක්‍රමයෙන් නැවැත්විය යුතුය. පළමු පියවර ලෙස සියලුම මහ නගර සභා රජයේ ප්‍රතිපාදන ලබා දීමෙන් ඉවත් කළ යුතු වේ. වසර පහක් ඇතුළත නගර සභා වෙත ලබා දෙන දායකත්වය ද ක්‍රමානුකූලව අඩු කළ යුතුය. ඉතිරි පළාත් පාලන ආයතන වෙත ද අරමුදල් ලබා දීම වෙන් වෙන්ව සලකා බලා අවම කරනු ලැබේ.

iii. නිශ්චිත කාල පරාසයක් තුළ ගාස්තු සංශෝධනය කිරීම මගින් පළාත් පාලන ආයතනවල මූල්‍ය තත්ත්වයන් වැඩිදියුණු කළ යුතුය. මේ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීම මඟින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව ශක්තිමත් කළ යුතුය. තක්සේරු ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට යොදා ගත හැකිවනසේ උචිත සූත්‍ර තක්සේරු කිරීම් සඳහා හඳුන්වා දිය හැකිය.

iv. ගාස්තු ප්‍රතිශෝධන සඳහා පනත් සංශෝධන කඩිනම් කළ යුතු අතර පළාත් පාලන ආයතනවල ආදායම් මාර්ග ශක්තිමත් කළ යුතුය.

v. ආදායම් එකතු කිරීමේ කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා පළාත් පාලන ආයතන විසින් පියවර ගෙන ඇතත්, 2022 අතුරු අයවැය යෝජනාවට අනුකූලව ස්වයංක්‍රීය සහ මාර්ගගත ගෙවීම් ක්‍රම තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

vi. රාජ්‍ය ආයතන විසින් දේශීය බදු ගෙවීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

vii. ජාතික රාජ්‍ය ආයතනවල පවතින අතිරික්ත මානව සම්පත්වලින් පළාත් පාලන ආයතනයන්හි පවතින හිඟය පියවා ගැනීම සඳහා මානව සම්පත් සංචිත කිරීම සහ හුවමාරු කර ගැනීම.

viii. පළාත් පාලන ආයතනයන්හි අරමුදල් උපයෝජනය පිළිබඳ අධීක්ෂණය ශක්තිමත් කළ යුතුය.

### *10: විශාල විශ්‍රාම වැටුප් වැය බර සහ පාරිතෝෂික ගෙවීමේ ප්‍රමාදයන්*

පොලීසියේ සහ සිවිල් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මඟින් පාලනය වන අතර ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම වැටුප් විවිධ නීති මඟින් පාලනය වන බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරන ලදී. 2023 ජාතික අයවැයෙන් සිවිල් සහ සන්නද්ධ හමුදාවන් හි විශ්‍රාම වැටුප් (රු.බි. 252), වැන්දඹු/පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (රු.බි. 65) සහ පාරිතෝෂිත දීමනා (රු.බි. 58) ලෙස රු.බි. 375ක් වෙන් කර ඇත. ඊට අමතරව, මියගිය සහ තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දි සඳහා රුපියල් බිලියන 42.5 ක මුදලක් වෙන් කර ඇත. පාරිතෝෂික ලෙස ගෙවිය යුතු හිඟ මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බවත්, පාරිතෝෂික දීමනා ලබා ගැනීම සඳහා දිගු විශ්‍රාමිකයන් ලැයිස්තුවක් පොරොත්තු ලේඛනයේ සිටින බවත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුව වෙත දන්වා සිටින ලදී. කොන්ත්‍රාත් හා තාවකාලික පදනමින් බඳවාගත් සේවකයන් එම තනතුරු ස්ථිර රැකියාවක් බවට පත්වීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන අතර එමඟින් ඉදිරියේදී විශ්‍රාම වැටුප් වියදම ඉහළ යනු ඇති බවද පෙන්වා දෙන ලදී. විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීමේ අවශ්‍යතාවය පිළිබඳව කමිටුව පුළුල් ලෙස සාකච්ඡා කළ අතර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ද එම අදහසට එකඟ විය. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ අදහස්, නිරීක්ෂණ සහ යෝජනා සලකා බලා මේ පිළිබඳ කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

***නිර්දේශ:***

i. දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු අතර විශ්‍රාම වැටුප් අරමුදලක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය.

ii. යෝජිත දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට කිසිදු පාරිතෝෂික ගෙවීමක් ඇතුළත් නොකළ යුතුය.

iii. එවැනි විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවන තුරු, දැනට පවතින අඩු කිරීම් භාවිතා කරමින්, වැන්දඹු/පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් ස්වාධීන අරමුදලක් ලෙස ස්ථාපනය කළ යුතුය.

iv. තාවකාලික පදනමින් බඳවා ගන්නා සේවකයන් හට විශ්‍රාම වැටුප් අයිතිය ලබා නොදිය යුතුයි. ඔවුන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල යටතේ සැලකිය හැකිය.

### *11: මියගිය සහ තුවාල ලැබූ රණවිරුවන් වෙනුවෙන් සේවා වන්දි ගෙවීම සඳහා ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන නමුත් ගෙවීම් කරනු ලබන්නේ ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය විසිනි.*

කමිටුව විසින් මෙම ගැටලුව පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය යන ආයතනවල නියෝජිතයන් සමඟ පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී. මියගිය සහ තුවාල ලැබූ රණවිරුවන් සඳහා වන සේවා වන්දි ලාභීන් 41,200 ක් පමණ සිටින බව දන්වා සිටින ලදී. ඔවුන්ගෙන් 33,000 ක් පමණ යුද හමුදාවෙන් වන අතර 2,600 ක් ශ්‍රී ලංකා පොලිසියෙන් ද, ඉතිරි පිරිස නාවික හා ගුවන් හමුදාවට අයත් වේ. සදාකාලික ආබාධිත රණවිරුවන්ට සහ සිය ජීවිත පරිත්‍යාග කළවුන්ගේ යැපෙන්නන් හට ගෙවනු ලබන වැටුප් හා වේතන, විශ්‍රාම වැටුප්, ආබාධිත ගෙවීම් සහ අනෙකුත් දීමනා පිළිබඳව මෙහිදී පැහැදිලි කරන ලදී. සේවා වන්දි ලාභීන්ගේ දත්ත ගබඩාවක් ඇතත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතු තොරතුරු සීමිත වන අතර ජීවන වියදම් දීමනාව ගෙවීම ද්විත්ව වීමේ හැකියාවක් පවතින බව කමිටුවේ අවධානයට යොමු විය.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහාම ස්ථාපිත වූ ආයතනයක් වුව ද එම දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ප්‍රතිපාදනවලින් දහයෙන් එකක් ත්‍රිවිධ හමුදාව විසින් හසුරුවනු ලබන බවට කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. එබැවින්, දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම මඟින් එහි විනිවිදභාවය ඉහළ නැංවීම හරහා මෙම ගැටළු නිරාකරණය කරගත යුතුය. මියගිය සහ තුවාල ලැබූ සෙබළුන් සඳහා වන සේවා වන්දිය විශ්‍රාම වැටුපක් නොව 1982 වසරේ, එනම් යුද්ධයේ මුල් අවධියේදී ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණවලට අනුව ගෙවනු ලබන වන්දි මුදලක් බව ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතයින් විසින් පැහැදිලි කරන ලදී. ප්‍රතිපාදන ලබාදෙනු ලබන්නේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට වන බැවින්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු බව කමිටුව විසින් අවධාරණය කරන ලදී. එසේ හෙයින්, කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ඉහත හෙළිදරව් කරන ලද තොරතුරු සලකා බලන ලදී.

***නිර්දේශ:***

i. ද්විකරණයන් වළක්වා ගැනීම සඳහා හඳුනාගැනීමේ පදනම ලෙස ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කරමින් දත්ත ගබඩාව පවත්වාගෙන යාම.

ii. ගෙවීම් සිදු කිරීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ වන යාන්ත්‍රණයක් මඟින් සිදු විය යුතුය.

### *12: සැලකිය යුතු ලෙස ඉහළ කුලී වියදම් සහ ඌන උපයෝජිත රජයේ ගොඩනැඟිලි*

රාජ්‍ය ආයතන සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජය විසින් රුපියල් බිලියන ගණනක මුදලක් වැය කර ඇති බව සාකච්ඡාවේදී ඉස්මතු කෙරිණි. කෙසේ වෙතත්, වාණිජමය ප්‍රදේශවල පවා ඇති ඇතැම් රජයේ ගොඩනැගිලි ඌන උපයෝජිතව පවතින අතරවාරයේ සමහර රාජ්‍ය ආයතන කුලියට ගත් ගොඩනැගිලිවල පිහිටුවා ඇත. ඉහළ වාණිජමය වටිනාකමකින් යුතු ප්‍රදේශවල ඇති ගොඩනැඟිලිවල පළමු මහල් කිහිපය පෞද්ගලික අංශය වෙත කුලියට දීමේ හැකියාවක් පවතින අතර, එමඟින් දෙපාර්ශ්වයම වෙත ප්‍රතිලාභ සැලසෙන බවද නිරීක්ෂණය විය.

### *නිර්දේශ:*

i. රජයේ ගොඩනැගිලිවල ඉඩ අවකාශය සම්බන්ධයෙන් විගණනයක් පවත්වා ඒවායේ ප්‍රශස්ත භාවිතය සහතික කිරීම.

ii. පුද්ගලික ගොඩනැගිලිවල ඇති රාජ්‍ය ආයතන හැකිතාක් රජයේ ගොඩනැගිලි වෙත ප්‍රතිස්ථානගත කිරීම.

iii. වඩාත් හිතකර කොන්දේසි යටතේ දේපල සංවර්ධනය කිරීම හෝ බදු දීම සඳහා රජය හට පෞද්ගලික ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව අවස්ථා පිළිබඳව සොයා බලා එවැනි හවුල්කාරිත්වයන් ඇති කරගැනීම.

iv. කොළඹ 07 පිහිටි සමිට් මහල් නිවාස (Summit Flats) පිහිටි ඉඩම වැනි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් ඌන උපයෝජිත ඉඩම්වල රාජ්‍ය සේවකයන් සඳහා ප්‍රමාණවත් තරම් නේවාසික පහසුකම් සපයමින් වාණිජමය ව්‍යාපාර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් වශයෙන් ඉදි කිරීම.

v. රජයේ ආයතන විසින් සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන ඉදිකිරීම නැවැත්විය යුතුය.

vi. පූර්ණ අධ්‍යයනයකින් පසු, පාඩු ලබන ඌන උපයෝජිත දේපල අන්සතු කළ යුතුය.

vii. පිරිවැය ඉතිරි කිරීමට සහ එක් එක් ආයතනවල කුලී වියදම් අඩු කිරීමට හේතු වන පරිදි සම්පත් සංචිත කිරීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ පහසුකම් හුවමාරු කර ගැනීම.

### *13: ඉන්ධන සහ වාහන සංචිත නඩත්තුවට අදාළ ඉහළ පිරිවැය*

අනුයුක්ත කරන ලද වාහනයක් සැපයීමේ පිරිවැය ප්‍රවාහන දීමනාව ලබා දීමට වඩා සැලකිය යුතු අන්දමින් ඉහළ බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. අනුයුක්ත කරන ලද වාහන ලබා දීම සඳහා රජයට කල්බදු සහ කුලී ගාස්තු වෙනුවෙන් සැලකිය යුතු මුදලක් ගෙවීමට සිදුවේ. තවද, රියදුරු කාර්යමණ්ඩලයක් ද පවත්වාගෙන යා යුතුය. එබැවින්, සැඟවුණු පිරිවැය තවදුරටත් වැඩි විය හැකිය. ඒ අතරම, මාර්ගගත ක්‍රමයට කැබ් රථ සේවා සපයා ගැනීමේ හැකියාවත් සමඟම, රාජ්‍ය නිලධාරීන් හට තමන්ගේම වාහනය භාවිතා කිරීමට වඩා වැඩි ගමනාගමන විකල්ප පවතියි.

***නිර්දේශ:***

i. අනුයුක්ත කරන ලද වාහන ලබා දීම වෙනුවට ප්‍රවාහන දීමනාව ලබා ගැනීම දිරිමත් කළ යුතුය.
ii. කුමන අවස්ථාවකදී වුවද, රජයේ සේවකයන් වෙත එක් වාහනයකට වඩා අනුයුක්ත නොකළ යුතුය.
iii. ප්‍රශස්ත උපයෝජනය සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ වාහනවල GPS මං සෙවුම් පද්ධතිය සවි කිරීම.
iv. රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ප්‍රවාහන දීමනා විවිධ සේවාවන් අතර වෙනස් වන බව දක්නට ලැබේ. වත්මන් ආර්ථික දුෂ්කරතා සැලකිල්ලට ගෙන එය තාර්කීකරණය කළ යුතුය.

### *14: මහා භාණ්ඩාගාරයට වැය බරක් වන රාජ්‍ය අංශයේ විදුලි පරිභෝජනය*

කමිටුව විසින් නිරීක්ෂණය කර ඇති පරිදි, රාජ්‍ය අංශය ප්‍රධාන විදුලි පාරිභෝගිකයෙකු වන අතර එහි වැය බර මහා භාණ්ඩාගාරයට දැරීමට සිදුව ඇත. සියලුම පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සලකා බලනු ලබන මෙම අමාත්‍යාංශය යටතට අයත් බැවින්, එය ද මුඛ්‍ය පාරිභෝගිකයෙකු බවට පත් වී ඇත. අනෙක් අතට, විදුලිය උත්පාදනයෙන් ස්වයංපෝෂිත වීම සඳහා පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමට රජයේ කාර්යාල සතුව ඉහළ විභවයක් ඇති අතර ඔවුනට ජාතික විදුලිබල පද්ධතියටද දායක විය හැකිය.

***නිර්දේශ:***

i. රාජ්‍ය ආයතන බලශක්තියෙන් ස්වයංපෝෂිත කිරීමට සූර්ය පැනල වැනි විදුලි උත්පාදනය සඳහා ඇති විකල්ප හඳුන්වා දිය යුතුය.

ii. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස රාජ්‍ය ගොඩනැගිලිවල සූර්ය පැනල සවි කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කළ හැකිය.

### *15: පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සම්බන්ධ කටයුතු ආයතන කිහිපයක් මඟින් මෙහෙයවීම*

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සම්බන්ධ කටයුතු පාර්ලිමේන්තුව සහ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය විසින් හසුරුවනු ලබන බව නිරීක්ෂණය විය. මෙම වැඩපිළිවෙල මඟින් පොදු කාර්ය පිරිවැය ඉහළ යන අතර මුළු වියදම එකවිට දැක්වීමක්ද සිදු නොවේ. මෙමඟින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට සේවාවන් ලබා ගැනීම සඳහා විවිධ ස්ථානවලට යාමට සිදු වන බැවින්, ඔවුන්ට ද දුෂ්කරතා ඇති වේ. එබැවින්, සියලුම සේවාවන් පාර්ලිමේන්තුව වෙත මාරු කිරීම ප්‍රයෝජනවත් වනු ඇති අතර එමඟින් එම කාර්යයන් කාර්යක්ෂමව හා පහසුවෙන් සිදු කරගත හැකි වේ.

***නිර්දේශ:***

i. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු පාර්ලිමේන්තුව විසින් කළමනාකරණය කළ යුතුය.

### *16: රාජ්‍ය භාෂා විෂය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන කිහිපයක් තිබීම*

රාජ්‍ය භාෂා සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය අරමුදලින් ක්‍රියාත්මක වන ආයතන කිහිපයක් තිබෙන බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. අමාත්‍යාංශයේ රාජ්‍ය භාෂා අංශය, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සහ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය එම ආයතන වේ. මීට අමතරව, භාෂා සම්බන්ධයෙන් කටයුතු කරන විශ්වවිද්‍යාල සහ ආයතන රාශියක් ඇත. මෙමඟින් ද්විකරණය, අකාර්යක්ෂමතා සහ පොදු කාර්ය වියදම් වැඩි විය හැකිය.

***නිර්දේශ:***

i. මෙම ආයතනවල කාර්යයන් සමාලෝචනය කළ යුතු අතර විෂය පථය සහ කාර්යභාරය නිර්වචනය කළ යුතුය.

ii. අවශ්‍ය වෙතොත්, ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කළ යුතුය.

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් (සභාපති) | අත්./ අපැහැදිලියි |
| එම්.එල්. ගම්මම්පිල මහතා | අතිරේක ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය (සාමාජික) | අත්./ අපැහැදිලියි |
| මහාචාර්ය ඩී.ඒ. ප්‍රේමකුමාර ද සිල්වා මහතා | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය (සාමාජික) | අත්./ අපැහැදිලියි |
| මහාචාර්ය දිල්රුක්ෂි යාපා අබේවර්ධන මිය | මහාචාර්ය/ ගිණුම්කරණ දෙපාර්තමේන්තු ප්‍රධානී, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය (සාමාජිකා) | අත්./ අපැහැදිලියි |
| ආචාර්ය මුදිත් සුජීව මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගිණුම්කරණ දෙපාර්තමේන්තුව, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය (සාමාජික) | අත්./ අපැහැදිලියි |